අප භාවිතා කරනා භාෂාව ඔස්සේ සමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා කෙරෙන බලපෑමක් මේ වනවිටද ලෝකයේ පුළුල් කතිකාවට ලක් වෙමින් පවතින මාතෘකාවකි. මෙහිදී අපට අතීතයේ සිට භාවිතා වන ඇතැම් යෙදුම් වර්තමානයට කෙතරම් ගැලපෙන්නේද යන්න පිළිබඳවද නැවත සිතාබැලීමට සිදුවේ.

ඊට උදාහරණයක් ලෙස කෙළෙසීම හා දූෂණය වැනි යෙදුම් ලිංගික අපරාධයන්/ලිංගික අපයෝජනයන් සඳහා භාවිතා වීම නිදසුනක් ලෙස ගත හැක. දූෂණය යන යෙදුම තවමත් නීති පොත් තුළ පවා භාවිතා වුවත්, මෙහි ඇති ගැටළුව වන්නේ දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් ඔස්සේ ගම්‍ය වන්නේ අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීමයි. මේ ඔස්සේ ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක්වූ වින්දිතයින් කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ නිර්මාණය වේ. එනිසා, දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට යෝග්‍ය වන්නේ ලිංගික අපරාධය/අපයෝජනය වේ.

පහත දැක්වෙන මව්බිම (11/25) පුවතේ සිරස්තලය තුළ "කෙලෙසීම" යන්නත්, පුවත් අන්තර්ගතය තුළ "දූෂණය" යන්නත් භාවිතා වන බව දැකිය හැක. එසේම එම පුවත් අන්තර්ගතය තුළම "අපහරණය" යනුවෙන්ද වඩාත් නිවැරදිව සඳහන් වී ඇත. එසේ නම්, මෙම පුවත සඳහා ලිංගික අපයෝජනය/අපහරණය් යන වඩාත් නිවැරදි යෙදුම් පමණක් යොදාගැනීමට හැකි නොවූයේ මන්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima